# BELIEVERS EASTERN CHURCH WORLD HEADQUARTERS

Office of the Metropolitan, St. Thomas Community, Kuttapuzha P. O., Thiruvalla - 689103 Kerala, India.

## SHEPHERD'S LETTER

August/September 2024

**ලොව පුරා සිටින සියලු, අගරදගුරුවරුන් සහ රදගුරුවරුන්, පූජකවරුන් සහ ඩීකන් පියවරුන්, ඉවැන්ජලිස්තවරුන් සහ කුරුසියේ සහෝදරියන්, සහ බිලීවර්ස් ඊස්ටන් චර්ච්හි සියලුම විශ්වාසිකයින් වෙත, සැබෑ වූ එකම දෙවියන් වහන්සේ වන, පියාණන් වහන්සේගේ ද පුත්‍රයාණන් වහන්සේගේ ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ ද නාමයෙන් - ආමෙන්. ✠**

**ක්‍රිස්තුන් වහන්සේ තුළ සහෘදයිනි,**

මෙය මා බිලීවර්ස් ඊස්ටන් චර්ච්හි මෙට්‍රොපොලිටන් හිමිපාණන් ලෙස පත්වීමෙන් පසුව ලියන පළමු එඬේර හසුනයි. ඔබ සියලු දෙනා මා හට දක්වන්නා වූ ප්‍රේමය සහ මා උදෙසා කරන යාච්ඤා වලට මාගේ මහත් කෘතවේදීත්වය පළකරමින් මෙසේ ලිපිය ආරම්භ කරමි. ප්‍රථමයෙන් මා අපගේ ස්වර්ගීය පියාණන්ට ස්තුති කරන්නෙමි. මන්ද යත්, ඔවුන් වහන්සේ අපට මහත් සේ විශ්වාසවන්ත වෙමින්, විශේෂයෙන්ම මෑත අතීතයේදී අප සමග සිටිමින් අපට මහත් සේ මඟ පෙන්වූ බැවිනි.

මෙම ලිපිය තුළින් ඉතා වැදගත් කරුණු කිහිපයක් කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට මම කැමැත්තෙමි.

**පළමුවෙන්ම:** 2024 ඔක්තෝම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත තරුණ සමුළුව.

අප සභාවේ අනාගතය යනු අපගේ තරුණ තරුණියන්ය. අපගේ මීසම් වල සිටින ඔවුන් ආධ්‍යාත්මිකව ශක්තිමත්ව, ජවසම්පන්නව, ක්‍රියාශීලීව කටයුතු කරන්නේ නම් අපගේ සභාවේ අනාගතය සුරක්ෂිත වනු ඇත. එම අරමුණ අපගේ මනසේ තබා ගනිමින් 2024 ඔක්තෝම්බර් මාසයේදී තරුණ සමුළුව පවත්වන්නට සැලසුම් කරමින් ඒ පිළිබඳව යාච්ඤා කරමින් සූදානම් වන්නෙමු. විවිධ දියෝකීස වල සිටින්නා වූ තෝරාගත් තරුණ තරුණියන් පිරිසක් එහිදී එක් රැස් වීමට නියමිතය. කරුණාකර මෙම තරුණ සමුළුව සම්බන්ධයෙන් දැඩි ඕනෑකමින් යුතුව යාච්ඤා කරන මෙන් ඉල්ලා සිටිමි.

**ඔබගේ පවුලේ යාච්ඤාවේදී ද මෙම කරුණ සම්බන්ධයෙන් යාච්ඤා කරන්න;** තරුණ සමුළුව අවසන් වනතෙක්ම ඔබගේ මීසමේ යාච්ඤා රැස්වීම් සංවිධානය කරන්න. මෙම රැස්වීමට සහභාගි වන තරුණ තරුණියන්ගේ ආරක්ෂාවත් ඔවුන්ගේ ගමනාගමනය සහ සංවිධානය කරමින් පවතින්නා වූ සියලුම දේ පිළිබඳව මෙන්ම මෙම සමුළුව අවසානයේදී අපගේ තරුණ තරුණියන් ශුද්ධ වූ ජීවිතයකට කැපවන පිණිස ද ආශිර්වාද කරන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.

**දෙවනුව:** අප මීසම් වල සිටින තරුණ තරුණියන් තුළ, අපගේ ශුද්ධ සභාවට සේවය කිරීම සඳහා ඔවුන්ගේ ජීවිත කැප කිරීමට පුහුණු වීම උදෙසා විශාල අවශ්‍යතාවයක් තිබේ. ජේසුස් වහන්සේ පැවසූ ආකාරයෙන්, ආධ්‍යාත්මික අවශ්‍යතාවයන් සහිත මිනිසුන් බොහෝ සිටිය ද එම අවශ්‍යතාවයන් සපුරාලිය හැකි අය සිටින්නේ ඉතා ස්වල්ප ප්‍රමාණයකි. ඉතිං, අපට කළ හැක්කේ කුමක්ද? එම කාර්යය ඉටු කිරීමට හැකි ආකාරයෙන් බොහෝ දෙනෙකු සේවය උදෙසා එවන ලෙස සමිඳුන්ගෙන් ඉල්ලා යාච්ඤා කිරීමය. (ශුද්ධවර මතෙව් 9:36-38) මෙම යාච්ඤා ඉල්ලීම අපගේ සියලුම යාච්ඤාවන් වලදී - දේවස්ථානයේත්, අපගේ නිවෙස් වලත් අඛණ්ඩව කරන යාච්ඤාවක් විය යුතුය. ඔබ මවක හෝ පියෙකු නම්, ඔබගේ දරුවන් දෙවියන් වහන්සේට සේවය කිරීමට කැප වූ ජීවිතයක් ගත කිරීමට තෝරා ගන්නා පිණිස ඔවුන් උදෙසා යාච්ඤා කරන්න. අපි පළමු උදාහරණය බවට පත්වෙමු. එවිට අන් අය අපව අනුගමනය කරනු ඇත.

**තෙවනුව:** අපගේ ප්‍රධාන සෙමනේරිය, දියෝකීසි සෙමනේරි සහ කුරුසියේ සහෝදරියන් පුහුණු මධ්‍යස්ථාන වල, නව අධ්‍යාපන සැසි ආරම්භ වී ඇත. ඒවායේ පුහුණුව ලබන සහෝදර සහෝදරියන් උදෙසා යාච්ඤා කරන්න: ඔවුන් අධ්‍යාපනය ලබා, පුරුදු පුහුණු වී දෙවියන් වහන්සේට සේවය කිරීම සඳහා කැප වී සිටී.

**සිව්වනුව:** අපගේ ශුද්ධ වූ සභාවේ මූල්‍යමය අවශ්‍යතාවයන් සපුරාගැනීමට හැකිවනු ඇතැයි යන විශ්වාසයෙන් සිටිමු. ගැඹුරු දරිද්‍රතාවයේදී පවා තමාට හැකි ප්‍රමාණයට වඩා ලබා දුන්, මසිදෝනියාවේ සභාව පිළිබඳව ශාන්ත පාවුළුතුමා අපට සිහිපත් කරවයි. (2 කොරින්ති 8:1-5) අපගේ ශුද්ධ සභාවද සැබවින්ම - දීම සම්බන්ධයේදී ඉතා ප්‍රසිද්ධ "තමන් සතු සියල්ල දුන්" දිළිඳු වැන්දඹු කාන්තාව මෙන් - නොමසුරුව - කැමැත්තෙන්, විශ්වාසවන්තව දෙන පිණිස යාච්ඤා කරන්න. (ශුද්ධවර මාක් 12:41-44). සතුටු සිතින් දෙන්නාට දෙවියන් වහන්සේ ප්‍රේම කරන බවත්, (2 කොරින්ති 9:6-7) අපි සතුටු සිතින් දෙන විට ඔවුන් වහන්සේ ස්වර්ගයේ කවුළු විවර කර ඔවුන් වහන්සේගේ ආශිර්වාද අප මත වගුරුවනු ලබන බවත් (මලාකි 3:10 -11) මතක තබා ගන්න,

දයාබර දරුවනි, මා මෙම හසුන අවසන් කිරීමට ප්‍රථම, අපගේ දේශයේ, පළාතේ සහ දිස්ත්‍රික්කයේ නායකයින් උදෙසා යාච්ඤා කිරීම සභාවක් ලෙස අප සැමගේ වගකීම බව මම ඔබට සිහිපත් කරන්නෙමි. (1 තිමෝති 2:1-4) අපි සියලු දෙනා විශ්වාසයෙන් යුතුව එය ඉටු කරමු. ප්‍රචණ්ඩත්වයට සහ අස්ථාවරභාවය හේතුවෙන් පීඩාවට පත්ව සිටින බංග්ලාදේශයේ සාමය සහ ස්ථාවරත්වය නැවතත් ඉක්මණින්ම එම රට තුළ ඇතිවේවා යැයි අපි ප්‍රාර්ථනා කරමු. එමෙන්ම ස්වභාවික විපත් වලට මුහුණ දීමට සිදු වූ ප්‍රදේශ වල සිටින ජනතාවට දෙවියන් වහන්සේගේ දයාව සහ කරුණාව අත්දකින්නට ලැබෙන පිණිස ඔවුන් උදෙසා යාච්ඤා කරන මෙන් ද කරුණාවෙන් ඉල්ලමි.

ආදරණීය සහෝදර සහෝදරියනි, අවසාන වශයෙන් අපගේ ආශිර්වාදලත් මතකයක් වූ මෝරන් මෝර් ඇතනේසියස් යොහාන් පළමු මෙට්‍රොපොලිටන් හිමිපාණන්, පැවසූ ආකාරයෙන්, අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත අපගේ සැලැස්මය; එය අපට මාලිමාවකි, එය අප ඕතඩොක්ස් ඇදහිල්ලේ මූලික මාර්ගෝපදේශනය යි. එම පොත නිතර නිතර කියවන්න; අපි ඒවා තනි

තනිවත්, සාමුහිකවත්, මීසමක් ලෙස සහ සභාවක් ලෙසත් එකට එක්ව අපගේ ජීවිත වලට අදාළ කර ගනිමු.

අප යන ඉදිරි ගමනේදී, අපගේ ඇස් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ වෙත යොමු කරමු. ශුද්ධ වූ සභාවේ සමිඳුන්, ඔවුන් වහන්සේට ප්‍රසන්න වූ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ශක්තිය සහ බලය දිනපතා අපට ලබා දෙන සේක. අපගේ ප්‍රේමය සහ සේවය ඉටු කිරීමේ දූත මෙහෙවර සිදු කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම නිරතුරුවම අපට ලැබෙනු ඇත. එමෙන්ම අපගේ සියලු උත්සාහන් පල දරා, එම පල සදාකල් පැවතීමටත්, එමගින් ශුද්ධ වූ ත්‍රිත්වයට එනම්, පියාණන් වහන්සේටත්, පුත්‍රයාණන් වහන්සේටත්, ශුද්ධාත්මයාණන් වහන්සේටත් මහිමයත්, ගෞරවයත්, නමස්කාරයත් දැනුත් මතුත් සදහටත් පුද කරන්නෙමු. ✠.

ක්‍රිස්තුන් වහන්සේ තුළ ඔබගේ පියාණන්,

දිනය :2024 අගෝස්තු මස 12 වෙනි දින

ස්ථානයඃ ලෝක මූලස්ථානය.

මෝරන් මෝර් සාමුවෙල් තියෝපිලස්
මෙට්‍රොපොලිටන් හිමිපාණන්.

---

**සැ.යුඃ කරුණාකර මෙය සියලුම ප්‍රාදේශීය භාෂාවන්ට පරිවර්තනය කර විශ්වාසිකයින් දිරිගැන්වීම සඳහා සියලුම දේවස්ථාන වල කියවීමට කටයුතු කරන්න.**